# 02 පරිච්ඡේදය
# ජාතික ගිණුම්කරණය

**කේ. කේ. තරිඳු උදයංග**
kktudayanga@sjp.ac.lk

**ප්‍රවේශය**

ආර්ථිකයක යම් කාලපරිච්ඡේදයක් තුළ නිපදවන ලද භාණ්ඩ හා සේවාවල අගය ජාතික නිෂ්පාදිතය ලෙස සැළකේ. ජාතික ගිණුම්කරණය මගින් මෙම ජාතික නිෂ්පාදිතය ගණනය කිරීම සිදු කරයි. ඒ අනුව කිසියම් කාලපරිච්ඡේදයක් තුළ දේශීය ආර්ථිකයේ ආර්ථික ප්‍රවාහයන්ගේ වටිනාකම ඇස්තමේන්තු කිරීමත්, සියලුම ආයතනික ඒකකයන්ට අදාළව කාර්ය සාධනය, ආර්ථික හැසිරීම හා එහි ව්‍යුහය ඇස්තමේන්තු කිරීමත් ජාතික ගිණුම්කරණය යටතේ සිදුවේ. රටක නිෂ්පාදිතයේ අගය මැනීම සඳහා ප්‍රවේශ තුනක් උපයෝගී කර ගත හැක. ඒවා නම් නිෂ්පාදන ප්‍රවේශය, ආදායම් ප්‍රවේශය හා වියදම් ප්‍රවේශයයි. මෙම එක් එක් ප්‍රවේශය යටතේ ජාතික ආදායම ගිණුම්කරණය කරන ආකාරය හඳුනාගැනීමත්, ජාතික ආදායම ගිණුම්කරණයෙහි වැදගත්කම සහ සීමාවන් පැහැදිලි කිරීමත් මෙම ලිපිය මගින් බලාපොරොත්තු වේ.

## 2.1 හැඳින්වීම

ඕනෑම රටක සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වයට දායක වන අංශ කීපයක් පවතී. මෙම අංශ හැඳින්වෙන්නේ ආර්ථික කාරක නමිනි. සාමාන්‍යයෙන් ඕනෑම ආර්ථිකයක මෙවැනි ආර්ථික කාරක හතරක් හඳුනාගත හැකිය. ඒවා නම් කුටුම්බ අංශය, ව්‍යාපාරික අංශය, රාජ්‍ය අංශය සහ විදේශ අංශය යනාදිය යි. සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වයට මෙම ආර්ථික කාරක දායක වන ආකාරය හඳුනාගැනීම ඉතා වැදගත් ය.

සාර්ව ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට කුටුම්භ අංශය දායක වන ආකාරය විමසා බැලීමේදී කැපීපෙනෙනම කාරණය වන්නේ ආර්ථිකයේ නිෂ්පාදන සාධක වල හිමිකාරීත්වය කුටුම්භ අංශය සතු වීමයි. මේ අනුව කුටුම්භ අංශය සතුව භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධකවල හිමිකාරීත්වය පවතී. ආර්ථිකයක ව්‍යාපාරික අංශයට සිය නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යාම සඳහා කුටුම්භ අංශය සතුව පවතින මෙම නිෂ්පාදන සාධක අවශ්‍ය වේ. එබැවින් කුටුම්භ අංශය තමා සතු නිෂ්පාදන සාධක ව්‍යාපාරික අංශය වෙත සපයා එමගින් ආදායම් උත්පාදනය කරගනී. එය සාධක ආදායම් ඉපයීම වශයෙන් හැඳින්වේ.

කුටුම්භ අංශය තමා සතු නිෂ්පාදන සාධක ව්‍යාපාරික අංශය වෙත සැපයීම තුළින් උපයනු ලබන සාධක ආදායම් භාවිත කරනුයේ ව්‍යාපාරික අංශය විසින්ම නිපදවන භාණ්ඩ හා සේවා මිලට ගැනීමට යි. මේ අනුව කුටුම්භ අංශය තමා සතු ආදායමෙන් කොටසක් වැය කරමින් භාණ්ඩ හා සේවා පරිභෝජනය කරන අතර තවත් කොටසක් ඉතිරි කරයි. එබැවින් ආර්ථිකයක ක්‍රියාකාරීත්වයට අතිශය වැදගත් ඉතිරිකිරීම් බිහි කිරීම සිදු කරනුයේ කුටුම්භ අංශය විසිනි. මීට අමතරව, කුටුම්භ අංශය රජයට බදු ගෙවන අතර රජය මගින් සපයනු ලබන අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි පොදු සේවා භුක්ති විඳීමද සිදු කරනු ලබයි.

සාර්ව ආර්ථිකයක ක්‍රියාකාරීත්වය සඳහා දායක වන දෙවන වැදගත් ආර්ථික කාරකය වන්නේ ව්‍යාපාරික අංශය යි. ව්‍යාපාරික අංශය සිදු කරනු ලබන වැදගත් කාර්යය වන්නේ කුටුම්බ

අංශයෙන් නිෂ්පාදන සාධක මිල දී ගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමත් එම නිෂ්පාදන භාණ්ඩ විකුණා ආදායම් ඉපයීමත් ය. මීට අමතරව ව්‍යාපාරික අංශය තමා උපයන ලාභවලින් හිමිකරුවන්ට ලාභාංශ ද රජයට බදු කොටසක් ද ලබා දී ඉතිරි ප්‍රමාණය ආයෝජන කටයුතු සඳහා වැයකරයි.

ආර්ථික කාරකයක් වශයෙන් රාජ්‍ය අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ බදු ආදායමෙන් මහජනතාවට පොදු භාණ්ඩ, සුභසාධන භාණ්ඩ හා සේවා සැපයීමත් ය. මීට අමතරව ජාතික ආරක්ෂාව, නීතිය හා සාමය රැකීම, පරිසරය සුරැකීම, අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි සේවා සැපයීම මෙන්ම මහාමාර්ග, සන්නිවේදනය වැනි ආර්ථික පොදු කාර්ය ප්‍රාග්ධනය සැපයීම ද රාජ්‍ය අංශයේ කාර්යයන් ය. එමෙන්ම, කුටුම්බවලට පාරිභෝගික සහනාධාරත් ව්‍යාපාරික අංශවලට නිෂ්පාදන සහනාධාරත් සැපයීමත් රාජ්‍ය අංශය මගින් සිදු කරයි. විදේශ අංශයේ ප්‍රධාන කාර්යයක් වන්නේ ආර්ථිකයක් තුළ භාණ්ඩ හා සේවා ආනයනය හා අපනයනය කිරීමයි. මීට අමතරව විදේශ සාධක ආදායම් ලැබීම් හා ගෙවීම් සිදු කිරීම ද විදේශ අංශය හරහා සිදු කෙරේ.


## 2.2 සාර්ව ආර්ථිකයක වෘත්තාකාර ප්‍රවාහය

ආර්ථික පද්ධතියක් තුළ පවතින සාර්ව ආර්ථික කාරක අතර පවත්නා ජාතික ආදායම් ප්‍රවාහයන්ගේ වටිනාකම් ජාතික ගිණුම් තුළින් දැක්වේ. එම ක්‍රියාවලිය රූප සටහනකින් දැක්වීම ජාතික ආදායමේ වෘත්තාකාර ප්‍රවාහය ලෙස හැඳින්වේ. ආර්ථිකයක් ක්‍රියාත්මක වන ආකාරය අනුව ප්‍රධාන ආකෘති තුනකි.

- සරල / ආවෘත ආර්ථිකය *(Simple Economy)*
- සංවෘත ආර්ථිකය *(Closed Economy)*
- විවෘත ආර්ථිකය *(Open Economy)*

මෙම ආර්ථිකයන් තුළ ක්‍රියාත්මක වන චක්‍රිය ප්‍රවාහය තුළ ආර්ථිකයේ පවත්නා සමස්ත නිමවුම, ආදායම හා වියදම පෙන්නුම් කෙරේ.

සරල ආර්ථිකය ප්‍රවාහ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, කුටුම්භ අංශයත්, ව්‍යාපාරික අංශයත් සරල ආර්ථිකය තුළ ක්‍රියාත්මක වේ. මෙම ආර්ථිකය තුළ කුටුම්භ අංශය සතු තම නිෂ්පාදන සාධක මුළුමනින්ම නිෂ්පාදන අංශයට සපයමින් එයින් ලබන ආදායම සම්පූර්ණයෙන්ම පරිභෝජනයට යොදවයි. මෙම ආර්ථිකය තුළ ආයෝජනයක්, ඉතිරි කිරීමක් හා ප්‍රාග්ධන භාණ්ඩ නිපදවීමක් සිදු නොකෙරේ. සරල ආර්ථිකයක් ක්‍රියාකාරිත්වය වෘත්තාකාර ආදායම් ප්‍රවාහයක් ඇසුරෙන් පැහැදිලි කිරීමේදී කාරක අතර පවතින අන්තර් සම්බන්ධතාව ද පැහැදිලි කිරීමට පහත රූප සටහන උපකාරි කර ගත හැකි ය.




2.1 රූපය: සරල ආර්ථිකයක ජාතික ආදායම් වෘත්තාකාර ප්‍රවාහය

තමන් සතු සාධක සේවා කුටුම්භයන් විසින් නිෂ්පාදන අංශයට සැපයීම සිදු කරයි. ඒ තුළින් මූර්ත ප්‍රවාහයක් බිහිවන අතර නිෂ්පාදන අංශය විසින් එම සාධක සේවා ලබා ගැනීම

වෙනුවෙන් කුටුම්භයන්ට ගෙවීම් කිරීම තුළින් මූල්‍ය ප්‍රවාහයක් බිහි කරයි. එමෙන්ම එම සාධක සේවා උපයෝගි කරගෙන නිපදවූ භාණ්ඩ හා සේවා කුටුම්භ අංශයට අළෙවි කිරීම තුළින් මූර්ත ප්‍රවාහයක් බිහි කරයි. කුටුම්භ අංශය විසින් තම සාධක ආදායම් උපයෝගී කරගෙන නිපදවූ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම තුළින් නැවතත් මූල්‍ය ප්‍රවාහයක් බිහි වේ. ආර්ථිකයක මුළු ආදායම මුළු වියදමට සමාන වන අවස්ථාව ආර්ථිකය සමතුලිත වන අවස්ථාව ලෙස සැලකේ.

මේ අනුව අංශ දෙකක් පමණක් ඇති සරල ආර්ථිකයක වෘත්තාකාර ප්‍ර ජාතික ගිණුම්කරණයේ ප්‍රවේශ තුනක් හඳුනාගත හැකිය. කුටුම්බ අංශයෙන් ලබා ගත් නිෂ්පාදන සාධක සංයෝග කොට ව්‍යාපාරික අංශය විසින් භාණ්ඩ හා සේවා නිපදවන අතර එය ජාතික ගිණුම්කරණයට අදාළව නිෂ්පාදන ප්‍රවේශය වශයෙන් හැඳින්වේ. ව්‍යාපාරික අංශය නිෂ්පාදන සාධක කුටුම්බ අංශයෙන් මිල දී ගන්නා විට කුටුම්බ අංශය වෙත සාධක ආදායම් ප්‍රවාහයක් ගමන් කරයි. එය ජාතික ගිණුම්කරණයේ ආදායම් ප්‍රවේශය වේ. ව්‍යාපාරික අංශය නිපදවනු ලබන නිෂ්පාදන භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට කුටුම්බ අංශය දරන වියදම් ජාතික ගිණුම්කරණයේ වියදම් ප්‍රවේශය වේ.

## 2.3 නිෂ්පාදන ප්‍රවේශය අනුව ජාතික ආදායම ගිණුම්කරණය

නිෂ්පාදන ප්‍රවේශය ඔස්සේ ප්‍රධාන වශයෙන් සිදු වන්නේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම යි. දළ දේශීය නිෂ්පාදිතය යනු කිසියම් කාල පරිච්ඡේදයක් තුළ (සාමාන්‍යයෙන් වර්ෂයක් වැනි කාල සීමාවක් තුළ) රටක ආර්ථික ප්‍රදේශය ඇතුළත නිෂ්පාදනය කරන ලද සියලු ම අවසාන භාණ්ඩ හා සේවාවල වටිනාකම යි. නිමැවුම් ප්‍රවේශයට අනුව දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේ දී එක ම භාණ්ඩයේ වටිනාකම කිහිප වරක් එකතු වීමෙන් නිෂ්පාදිතයේ අගය අධිතක්සේරුවට ලක් වේ. මෙලෙස එක ම භාණ්ඩ වටිනාකම කිහිප වරක් නිෂ්පාදිතයේ අගයට ඇතුළත් වීම බහුගණන දෝෂය ලෙස හඳුන්වයි. මේ නිසා බහුගණන දෝෂය මඟ හරවා ගැනීම සඳහා සමස්ත නිෂ්පාදිතය ගණනය කිරීමේ ක්‍රම දෙකක් පවතී. ඒවා නම්, අවසාන නිෂ්පාදිත ක්‍රමය සහ එකතු කළ වටිනාකම් ක්‍රමය යි.

අවසාන නිෂ්පාදිත ක්‍රමයට නිෂ්පාදිතය ගණනය කළ ද දළ එකතු කළ වටිනාකම් ක්‍රමයට ගණනය කළ ද ඒ සඳහා ලැබෙන අගය සමාන විය යුතු ය. නිෂ්පාදිත ක්‍රියාවලියේ අවසාන අදියර පසු කළ, එනම් තවදුරටත් සකස් කිරීමෙන් තොර ව පරිභෝජනය හෝ ආයෝජනය හෝ සඳහා යොදාගත හැකි භාණ්ඩ හෝ සේවා පමණක් ජාතික ගිණුම්වලට ඇතුළත් කිරීම අවසාන නිෂ්පාදිත ක්‍රමය යි. අවසාන නිෂ්පාදිත ක්‍රමයට අනුව සමස්ත නිෂ්පාදිතය ගණනය කරනුයේ පරිභෝජන භාණ්ඩ හා ප්‍රාග්ධන භාණ්ඩවල නිෂ්පාදනයේ එකතුවට තොග වෙනස් වීම් ගැළපීමෙනි.

බහු ගණන දෝෂ මඟහැරවීමට අවසාන නිමැවුම් ක්‍රමය භාවිත කළ ද එහි ද ගැටලු පවතී. එනම් ඇතැම් විට පාරිභෝගික භාණ්ඩ හා අන්තර් භාණ්ඩ වෙන් කොට හඳුනා ගැනීමේ දුෂ්කරතා පැවතීම යි. නිදසුන් වශයෙන් සැලකීමේ දී සීනි අවසාන පාරිභෝගික භාණ්ඩයක් වුව ද රස කැවිලි නිෂ්පාදකයාට එය අන්තර් භාණ්ඩයක් විය හැකි ය.

අවසාන නිමැවුම් ක්‍රමයේ පවතින මෙම ගැටලු තත්ත්වය මගහරවන නිමැවුම තක්සේරු කිරීමේ වඩාත් සුදුසු ම ක්‍රමය වන්නේ එකතු කළ වටිනාකම් ක්‍රමය යි. නිෂ්පාදිතයේ එකතු කළ වටිනාකම යනු (GVA) භාණ්ඩවල හා සේවාවල නිමැවුමේ දළ වටිනාකමින් (GVO) අතරමැදි යෙදවුම්වල (අතරමැදි පරිභෝජනය) වටිනාකම අඩු කළ විට ලැබෙන අගය වේ. මෙහි දී, නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවාවල මූල්‍යමය වටිනාකම නිමැවුමේ දළ වටිනාකම ලෙස හඳුන්වයි (GVO). නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් මිල දී ගනු ලබන භාණ්ඩ හා සේවා අතරමැදි යෙදවුම් ලෙස හඳුන්වයි.

නිෂ්පාදිතයේ එකතු කළ වටිනාකම ගණනය කළ හැකි ආකාර දෙකකි. ඒවා නම් නිෂ්පාදන මූලාශය සහ ආදායම් මූලාශ්‍රය යි. නිෂ්පාදන මූලාශ්‍රය අනුව එකතු කළ අගය ගණනය කරනුයේ නිමැවුමේ වටිනාකමින් පිටතින් ලබා ගත් සියලුම යෙදවුම්වල වටිනාකම අඩු කිරීමෙනි. ආදායම් මූලාශ්‍රය අනුව එකතු කළ අගය ගණනය කරනුයේ නිෂ්පාදන ක්‍රියාවලියට සහභාගි වන සියලු ම නිෂ්පාදන සාධකවලට ලැබෙන සාධක ආදායම් සහ ස්ථාවර ප්‍රාග්ධනය උපයෝජනය කිරීමෙන් හට ගන්නා ක්ෂය වීම් එකතු කිරීමෙනි.

නිෂ්පාදන ප්‍රවේශය යටතේ ජාතික ආදයම ගිණුම්කරණයේ දී වැදගත් සංකල්පයක් වන්නේ නිෂ්පාදන ඉම සංකල්පයයි. නිෂ්පාදන ඉම සංකල්පය භාවිත කරනුයේ ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම් සහ ආර්ථික නොවන නිෂ්පාදන ක්‍රියාකාරකම් වෙන් කර අර්ථ දැක්වීමට යි. SNA - 2008 ජාතික ගිණුම්කරණ ක්‍රමවේදයට අනුව නිෂ්පාදන ඉම ඉතා පැහැදිලි ව විස්තර කරයි. නිෂ්පාදන ඉම පැහැදිලි කිරීමේ දී ඉටු කරන ප්‍රධාන කාර්යය අනුව නිෂ්පාදකයින් ප්‍රධාන කොටස් තුනකට වර්ග කර ඇත. ඒවා නම්,

- වෙළෙඳපොළ අරමුණු කොටගත් නිෂ්පාදකයන්
- වෙළෙඳපොළ අරමුණු කොට නොගත් වෙනත් නිෂ්පාදකයන්
- ගෘහ ආර්ථික ඒකක කටයුතු අයත් නිෂ්පාදකයන්

ජාතික ගිණුම්කරණයේ දී නිෂ්පාදනයේ ඉම තුළට ඇතුලත්කළ යුතු නිෂ්පාදන ක්‍රියාකාරකම් කීපයක් පවතී. ඒවා පහත පරිදි වේ.

- වෙළෙඳපොලේ විකිණෙන සියලුම භාණ්ඩ හා සේවාවන් නිෂ්පාදන ඉමට ඇතුළත් වේ
- නිෂ්පාදනය කළ ආයතනය හැර සෙසු ආයතනික ඒකක සඳහා නිෂ්පාදනය කරන ලද සියලුම භාණ්ඩ හා සේවා
- තමන්ගේ ම අවසාන පරිභෝජනය සඳහා හෝ ප්‍රාග්ධන සම්පාදනය සඳහා හෝ නිෂ්පාදනය කොට ඒවායේ නිෂ්පාදකයන් විසින් තමන් වෙත රඳවා ගන්නා ලද සියලුම භාණ්ඩ
- තමන් සතු ව ඇති තමන් පදිංචි වී සිටින නිවාසවලින් ලබා දෙන නේවාසික සේවය
- වැටුප් ලබන සේවකයන් විසින් ඉටු කරනු ලබන ගෘහ සේවා සහ පෞද්ගලික සේවා
- තමන්ගේ ම පරිභෝජනය සඳහා කෘෂි භෝග නිෂ්පාදනය, ඒවා ගබඩා කොට තබා ගැනීම, වනාන්තරවලින් ආහාර භෝග ලබා ගැනීම හා පලතුරු රැස් කර ගැනීම, දර කැපීම සහ එකතු කිරීම, දඩයම් කිරීම සහ මසුන් අල්ලා ගැනීම
- කෘෂි නිෂ්පාදන සැකසීම, වී කොටා සහල් සකසා ගැනීම, පිටි කොටා ගැනීම, මස් මාළු කල් තබා ගැනීම සඳහා පිළියෙළ කිරීම, පලතුරු බෝතල් කිරීම හා වියලා ගැනීම, කිරි මුදවා ගැනීම, කුඩ සහ පන් මලු විවීම, පැදුරු විවීම ආදිය
- රෙදි විවීම, ඇඳුම් මසා ගැනීම, ගොතන ලද ඇඳුම් සහ තොප්පි, ගෘහ භාණ්ඩ තනා ගැනීම
- ජලය සපයා ගැනීම

මෙලෙස ගෘහ ඒකකය තුළ සිදුවන භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාකාරකම් නිෂ්පාදන ඉමට ඇතුළත් කළ ද ගෘහ ඒකකයේ සාමාජිකයා විසින් තමන්ගේ ම පෞද්ගලික පරිභෝජනය සඳහා ඉටු කරනු ලබන සේවා ආර්ථික නිෂ්පාදන ක්‍රියාවන් ලෙස නොසැලකයි. මේ සඳහා උදාහරණ වශයෙන් දරුවන් රැකබලා ගැනීම, නිවසේ වියපත් හා අබාධිතයින් රැකබලා ගැනීම ආදිය දැක්විය හැකිය.

කෙසේ වෙතත් මිනිසාගේ මැදිහත් වීමක් සහිත ද නැද්ද යන්න මත නිෂ්පාදන ඉමට ඇතුළත් කිරීම හෝ නොකිරීම සිදුවේ. ස්වාභාවික සම්පතක් වුව ද පුද්ගලයෙකුගේ පාලනයට නතුවී නිෂ්පාදනයක් බිහි වන්නේ නම් ඒවා නිෂ්පාදන ඉමට අයත් වේ. දළ දේශීය නිමැවුම ගණනය කිරීමේ දී නිරීක්ෂණය නොවන ආර්ථික කටයුතු ද ඇතුළත් විය යුතු ය. නිරීක්ෂණය නොවන

ආර්ථික කටයුතු කොටස් දෙකකින් සමන්විත වේ. එනම් සැඟැවුණු ආර්ථික කටයුතු සහ නීත්‍යානුකූල නොවන ආර්ථික කටයුතු යනාදිය යි.

සැඟැවුණු ආර්ථික ක්‍රියාකාරකම් ලෙස සලකනු ලබන්නේ විධිමත් ගණනය කිරීමකට පාත්‍ර නොවන නීත්‍යානුකූල ආර්ථික ක්‍රියාකාරකම් ය. වුවමනාවෙන් ම මෙම ආර්ථික ක්‍රියා වසන් කොට තබා ගැනීමට උත්සාහ දැරීමට බලපාන හේතු කීපයක් පවතී. බදු ගෙවීමෙන් වැලකී සිටීම, සමාජ ආරක්ෂණ දායක මුදල් ගෙවීමෙන් වැලකී සිටීම යනාදිය මීට උදාහරණ වශයෙන් සැලකිය හැකිය.

මීට අමතරව දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී ඊට ඇතුළත් නොවන ඵලදායී ආර්ථික කටයුතු කීපයක් ද පවතී. ඒවා පහත පරිදි දැක්විය හැකිය.

- ගෙවීමකින් තොර ව නිවස තුළ ඉටු කරනු ලබන ගෘහ සේවය (නොගෙවූ ගෘහ සේවා)
- නොමිලේ ලැබෙන ස්වාභාවික සම්පත් (භූමිය, ජලය, වාතය ආදිය)
- මිනිස් ශ්‍රමයකින් තොර ව වර්ධනය වන ස්වාභාවික සම්පත් (වනාන්තර ආදිය)
- ඉගෙනීම හා විවේකය
- මිල වෙනස් වීම හෝ ස්වාභාවික වර්ධනය හෝ මගින් සම්පත්වල සිදුවන වටිනාකම වෙනස් වීම

එමෙන්ම දේශීය නිමවුම ගණනය කිරීමේ දී සංක්‍රාම, මුදල්මය පත්‍රිකා ආශ්‍රිත ගණුදෙනු යනාදී ඵලදායී නොවන වෙළඳපළ ගණුදෙණු බැහැර කෙරේ.

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිමැවුම ගණනය කිරිමේ දී භාවිත කරන ප්‍රධාන ආකෘති දෙකකි. ඒවා නම් කර්මාන්ත මූලය අනුව වර්ගීකරණය සහ ආයතනික අංශ අනුව වර්ගීකරණය යි. ශ්‍රී ලංකාවේ සම්මත කර්මාන්ත කටයුතුවලට මූලික වශයෙන් ඇතුළත් වන ශීර්ෂයන් පහත දැක්වේ.

- කෘෂි කර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය
- පතල් කැණිම්, නිෂ්පාදන කර්මාන්ත විදුලිය හා ජලය නිෂ්පාදන කටයුතු
- ඉදිකිරීම්
- වෙළෙඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීම සේවා
- තොරතුරු හා සන්නිවේදන කටයුතු පිළිබඳ සේවා
- මූල්‍ය හා රක්ෂණ සේවාවන්
- නිවාස අයිතිය හා දේපොළ වෙළෙඳාම
- වෘත්තීය, විද්‍යාත්මක, පරිපාලන සහ සහාය සේවාවන්
- රාජ්‍ය පරිපාලනය, ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය හා සමාජ ආරක්ෂණ සේවාව
- වෙනත්

භාණ්ඩ නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් මත පනවනු ලබන විවිධ බදු සහ ලබාදෙන සහනාධාර කරණ කොට එකම භාණ්ඩයක් පිළිබඳව මිල ප්‍රභේද තුනක් දක්නට ලැබේ. ඒවා නම්, මූලික මිල, නිෂ්පාදකයන්ගේ මිල සහ ගැණුම්කරුවන්ගේ මිල යනාදිය යි.

මෙහි දී මූලික මිල යනුවෙන් හැඳින්වෙන්නේ නිෂ්පාදකයා තම භාණ්ඩය හෝ සේවාව හෝ නිෂ්පාදනය කොට අලෙවි කිරීමට සුදුසුකම් කොට ඇති අවස්ථාවකදී එම භාණ්ඩය හෝ සේවාව සඳහා අදාළ මිල යි. මෙය ගැණුම්කරුවාගෙන් නිෂ්පාදකයාට ලැබිය යුතු මිලකි. නිෂ්පාදනය මත පනවනු ලබන බදු මෙම මූලික මිලට ඇතුළත් නොවන අතර විකිණීමේදි නිෂ්පාදකයාට ලැබුණු සහනාධාර ඇතුළත් වේ. නමුත් නිෂ්පාදනය මත කිසියම් වෙනත් බද්දක් නිෂ්පාදකයා විසින් දරනු ලැබුවහොත් එම නිෂ්පාදනය මත පනවන ලද වෙනත් බදු අඩු කළ යුතු වේ. ප්‍රවාහන වියදම මූලික මිලට ඇතුළත් නොවේ. මූලික මිල නිෂ්පාදන තීරණ ගැනීමේදී අදාළ වේ.

මූලික මිලට නිෂ්පාදකයා වෙත සෘජුවම පැවරූ නිෂ්පාදිත බදු එකතු කොට නිෂ්පාදකයාට ලබා දුන් සහනාධාර අඩු කිරීමෙන් පසු ලැබෙන අගය නිෂ්පාදකයන්ගේ මිල ලෙස අදහස් කෙරේ.

එනම්, නිෂ්පාදන ස්ථානයෙන් වෙළෙඳුන් කරා භාණ්ඩය ඉවතට යන විට නිෂ්පාදකයා විසින් අය කරනු ලබන මිලයි. මෙහිදී ගැණුම්කරුවන් විසින් ගෙවීමට ඉන්වොයිස් කරන ලද අඩු කර ගත හැකි ඒ්ඹ බදු ඉවත් කරන අතර අඩු කළ නොහැකි ඒ්ඹ බදු පමණක් ඇතුළත් කෙරේ.

පාරිභෝගිකයා සත්‍ය වශයෙන්ම භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවන මිල ගැණුම්කරුවන්ගේ මිල ලෙස හැඳින්වේ. නිෂ්පාදකයන්ගේ මිලට අතිරේකව ප්‍රවාහන ගාස්තු, වෙළෙඳ ආන්තිකයන් සහ ගැණුම්කරුවන් විසින් ගෙවිය යුතු බදු ඇතුළත් කොට ගැණුම්කරුවන්ගේ මිල සැකසේ. මෙහිදී නිෂ්පාදකයා ලැබූ සහනාධාර ඇතුළත් වන්නේ නැත. එමෙන්ම අඩු කළ හැකි VAT හැර එම භාණ්ඩය මත අය කර ඇති සියලුම බදු ඇතුළත් වේ.

මේ අනුව වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය පහත තුන් ආකාරයකට ගණනය කළ හැක.

| | | | | |
|---|---|---|---|---|
| වෙළඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය | = | දළ එකතු කළ අගයන්ගේ එකතුව (මූලික මිල යටතේ) (ΣGVA) | + | සියලුම නිෂ්පාදිත මත (ආනයන ඇතුළත්ව) ශුද්ධ බදු (බදු - සහනාධාර) |

| | | | | |
|---|---|---|---|---|
| වෙළඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය | = | දළ එකතු කළ අගයන්ගේ එකතුව (නිෂ්පාදකයන්ගේ මිල යටතේ)(ΣGVA) | + | ආනයන මත ශුද්ධ බදු (බදු - සහනාධාර) |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වෙළඳපොළ යටතේ දළ දේශීය නිෂ්පාදිතය | = | නිමවුමේ දළ වටිනාකමේ ඓක්‍යය (වෙළඳපොළ මිල යටතේ) (ΣGVO) | - | අතරමැදි පරිභෝජනය (IC) | + | නිෂ්පාදිතය මත ශුද්ධ බදු | + | ආනයන මත ශුද්ධ බදු (බදු - සහනාධාර) |

**2.4 ආදායම් ප්‍රවේශය යටතේ ජාතික ආදායම ගිණුම්කරණය**

නිෂ්පාදන ක්‍රියාවලියක් තුළ කර ගත් සියලුම නිෂ්පාදන සාධක සඳහා කරනු ලබන ගෙවීම් හෙවත් සාධක ඉපයීම් පදනම් කරගෙන නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කිරීම ආදායම් ප්‍රවේශය තුළ බිහිවන ආදායම් ස්වරූප කිහිපයකි. එම ආදායම් ස්වරූප ප්‍රාථමික ආදායම් ලෙස හඳුන්වනු ලැබේ. ප්‍රාථමික ආදායම යනු නිෂ්පාදන ක්‍රියාවලියේ නියුතු වීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ නිෂ්පාදනයට අවශ්‍ය කරන වත්කම් හිමිකර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනික ඒකකවලට ලැබෙන ආදායමයි. ප්‍රාථමික ආදායමේ අන්තර්ගතයන් වනුයේ,

- සේවක ආදායම (CE)
- මෙහෙයුම් අතිරික්තය (OS)
- නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු (t-s)
- මිශ්‍ර ආදායම (MI)

නිෂ්පාදන ක්‍රියාවලියක් නිසා ජනනය කෙරෙන මෙම ආදායම් සමූහය නිෂ්පාදනයේ දළ එකතු කළ අගය (GVA) ට සමාන වේ.

$$GVA = \{CE + OS + MI + (t-s)\}$$

නිෂ්පාදන ක්‍රියාවලියට දායක වීම තුළින් සේවකයෙකුට නිෂ්පාදන ඒකකයකින් හිමිවන සියලුම ආදායම්වල සමස්තය සේවක ආදායම ලෙස සැලකේ. ඒ තුළට වැටුප් හා වේතන,සේවායෝජකයා විසින් ලබා දෙන සමාජ ආරක්ෂණ දායක මුදල්, රෝගී තත්ත්වයකදී, විරැකියා අවස්ථාවක දී හා විශ්‍රාම ගන්නා විටදී සේවායෝජකයා විසින් ඍජුවම සේවකයාට ලබා දෙන අරමුදල් ඇතුළත් වේ.

මෙහෙයුම් අතිරික්තය ලෙස අදහස් කරනුයේ සමාගමික අංශය ජනනය කෙරෙන ආදායම යි. නිෂ්පාදනයේ වටිනාකමින් සියලුම පිරිවැය සහ ශුද්ධ නිෂ්පාදන බදු (බදු - සහනාධාර) ඉවත් කළ විට දළ මෙහෙයුම් අතිරික්තයේ අගය ලැබේ. මෙය බදු කුලී, පොළ ලාභය යන දේපොළ ආදායම් යන සාධක වලින් සමන්විත වේ.

ගෘහ ඒකක විසින් හිමිකරගෙන සිටින හෝ හවුල් ව්‍යාපාර වශයෙන් පවත්වාගෙන යනු ලබන හෝ සමාගමික නොවන ව්‍යවසායන් ජනනය කෙරෙන ආදායම මිශ්‍ර ආදායම ලෙස සැලකේ. පවුලේ සාමාජිකයන් මෙවැනි වූ ව්‍යාපාර තුළ වැටුප් නොලබා සේවය කරන බැවින් මෙම ව්‍යාපාරවල ඉපයීම්වලින් කොටසක් සේවක ආදායම් ලෙස නිරූපනය කෙරෙන අතර තවත් කොටසක් මෙහෙයුම් අතිරික්තය ලෙස නිරූපනය කෙරේ. ගෘහ ඒකක විසින් පවත්වාගෙන යනු ලබන මෙවැනි ව්‍යවසායයන්ගේ ඉපයීම්වලින් අතරමැදි පරිභෝජනය සියලුම ශුද්ධ බදු සහ වැටුප් ලබන සේවකයන්ගේ ගෙවීම් අඩු කළ ඉතිරි වන ප්‍රමාණය මිශ්‍ර ආදායම ලෙස සැළකේ.

ආණ්ඩුවේ ප්‍රාථමික ආදායම ලෙස නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු මෙන්ම නිෂ්පාදනය හා ආනයන මත ලබා දෙන සහනාධාර සැලකේ. ආදායම සහ ධනය මත රජය විසින් අය කරනු ලබන බදු මීට ඇතුළත් නොකෙරේ. ප්‍රාථමික ආදායම් සියල්ලෙහිම එකතුව දළ දේශීය ආදායම ලෙස හඳුන්වන අතර එය දළ දේශීය නිෂ්පාදිතයේ අගයට සමාන වේ.

මේ අනුව ප්‍රාථමික ආදායම් සියල්ලෙහිම එකතුව දළ දේශීය ආදායම ලෙස හඳුන්වයි. ජාතික ආදායම යනු නේවාසිකයන් සතු නිෂ්පාදන සාධක විදේශ කටයුතුවල යෙදවීමෙන් ලබන ආදායම් සහ නිර්නේවාසිකයන් සතු නිෂ්පාදන සාධක දේශීය නිෂ්පාදන කටයුතු සඳහා යෙදවීම වෙනුවෙන් සිදු කරන ලද ගෙවීම් ගැළපීම තුළින් ලැබෙන අගයයි.

දළ ජාතික ආදායම = දළ දේශීය නිෂ්පාදිතය + විදේශ ශුද්ධ සාධක ආදායම

නේවාසික ඒකකවල ක්‍රය ශක්තිය පෙන්නුම් කරන්නේ වැය කළ හැකි ආදායම තුළිනි. අනේවාසික ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ප්‍රේශණ, අනේවාසික රක්‍ෂණ සමාගම් විසින් ගෙවනු ලබන හිමිකම් වැනි දෑ සංක්‍රාම ලෙස සැලකේ. නමුත් මෙවැනි සංක්‍රාම ආදායම් ලෙස නොසැලකේ. එහෙත් මෙවන් සංක්‍රාම නේවාසිකයන්ගේ ක්‍රයශක්තිය තීරණය වීමට බලපාන බැවින් වැය කළ හැකි ආදායම ගණනය කිරීමේදී සැලකිල්ලට ගැනේ. දළ ජාතික ආදායමට ශුද්ධ විදේශ සංක්‍රාම ගැළ හැකි දළ ජාතික ආදායම ලැබේ.

සාධක සේවා සැපයීම වෙනුවෙන් කුටුම්භයන්ට ලැබෙන ආදායම කුටුම්භ ආදායම ලෙස සැලකේ. මෙය පෞද්ගලික ආදායම ලෙස ද හඳුන්වනු ලැබේ. දළ ජාතික ආදායම සහ කුටුම්භවලට ලැබෙන සංක්‍රාමවල එකතුවෙන් රජයේ දේපොළ ආදායම, ක්ෂය වීම්, සමාගමික ලාභ බදු, රඳවාගත් ලාභ, සමාජ සංරක්‍ෂණ ක්‍රමවලට ශ්‍රමිකයන්ගෙන් කෙරෙන දායක වීම යනාදිය ඉවත් කළ පසු කුටුම්භ ආදායම ගණනය කළ හැකිය. වැය කළ හැකි කුටුම්භ ආදායම යනු කුටුම්භවලට ලැබෙන ආදායමෙන් කුටුම්භවලට වියදම් දැරීම සඳහා යොදා ගත හැකි ආදායම යි. කුටුම්භ ආදායමෙන් කුටුම්භ ඍජු බදු අඩු කළ පසු වැය කළ හැකි කුටුම්භ ආදායම ලැබේ.

### 2.5 වියදම් ප්‍රවේශය යටතේ ජාතික ආදායම ගිණුම්කරණය

වියදම් ප්‍රවේශය ඔස්සේ සාකච්ඡා කෙරෙනුයේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම එම නිෂ්පාදිතය මිලදී ගැනීම සඳහා දරනු ලබන වියදම ගණනය කිරීම. සාර්ව ආර්ථිකය තුළ ප්‍රධාන කාරකයන් හතරක් ක්‍රියාත්මක වේ. එම ක්‍රියාකාරයන් ලෙස කුටුම්භ අංශය, ව්‍යාපාරික අංශය, රාජ්‍ය අංශය හා විදේශීය අංශය ලෙස හැඳින්විය හැකිය. මෙම එක් එක් අංශය විසින් දළ දේශීය නිෂ්පාදිතය තුළ ඇතුළත් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා වියදම් කරනු ලැබේ.

කුටුම්බ අංශය විසින් දරන පෞද්ගලික පරිභෝජන වියදම (C), ව්‍යාපාරික අංශය විසින් දරන දළ දේශීය පෞද්ගලික ආයෝජන වියදම (I), සහ රාජ්‍ය අංශය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට දරන වියදම (G), යනාදියෙහි එකතුවෙන් විදේශීය අංශය සමග වෙළෙඳාම තුළින් බිහිවන ශුද්ධ අපනයන (NX) ඉවත් කළ පසු වියදම් ප්‍රවේශය යටතේ දළ ජාතික නිෂ්පාදිතය ගණනය කළ හැකිය.

කුටුම්භ අංශය විසින් තම වුවමනා ඉටු කර ගැනීම උදෙසා භාණ්ඩ හා සේවා භාවිත කිරීම පරිභෝජනය ලෙස අදහස් කෙරේ. පරිභෝජන වියදම අවසාන පරිභෝජන වියදම සහ සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම වශයෙන් ස්වරූප දෙකකින් දැක්විය හැකිය. කුටුම්භයන් විසින් තම පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා අත්පත් කරගැනීම උදෙසා දරන වියදම අවසාන පරිභෝජන වියදම ලෙස අදහස් කෙරේ. අවසාන පෞද්ගලික පරිභෝජන වියදම පෞද්ගලික පරිභෝජන වියදම සහ රාජ්‍ය පරිභෝජන වියදම වශයෙන් නැවතත් වර්ග කළ හැකිය.

කුටුම්භ පරිභෝජන වියදම සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන අංශය කුටුම්භ සඳහා කරනු ලබන මිලදී ගැනීම්වල එකතුවක් ලෙස පෞද්ගලික පරිභෝජන වියදම සමන්විත වේ. කුටුම්භයන් විසින් හෝ කුටුම්භයන් සඳහා හෝ භාණ්ඩ අත්පත් කර ගැනීම, කුටුම්භ විදේශ රටවලදී පරිභෝජනය සඳහා කරන වියදම් ද, පිටරටින් කුටුම්භවලට ලැබෙන ත්‍යාග යනාදිය පෞද්ගලික පරිභෝජන වියදමට ඇතුළත් කරන අතර භාවිත කළ භාණ්ඩ සඳහා කරන වියදම් පෞද්ගලික පරිභෝජන වියදමට ඇතුළත් නොකෙරේ.

මධ්‍යම රජය සහ එහි උප ආයතන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා දරන වියදම රාජ්‍ය පරිභෝජන වියදම ලෙස හැඳින්වේ. රාජ්‍ය පරිභෝජන වියදම පුද්ගල පරිභෝජන වියදම ලෙසත්, සමූහ පරිභෝජන වියදම ලෙසත් වර්ග කළ හැකිය. අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ ආරක්ෂණ වියදම්, සුබසාධන වියදම් යනාදිය සඳහා රජය විසින් දරන වියදම් පුද්ගල පරිභෝජන වියදම ලෙස සැලකෙන අතර රාජ්‍ය පරිපාලන වියදම්, දුම්රිය සහ මහාමාර්ග සඳහා දරන වියදම්, ආරක්ෂණ වියදම් යනාදිය සමූහ පරිභෝජන වියදම් ලෙස සැලකේ.

සෑම විටම වියදම් දරන්නා සහ පරිභෝජනය කරන්නා එකම පුද්ගලයා නොවන බැවින් මුදල් වියදම් කරන්නේ කවරෙකුද යන්න පිළිබඳ නොසලකා, සැබවින්ම භාණ්ඩ හා සේවා අත්පත් කරගැනීම සඳහා දරන වියදම සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම ලෙස අදහස් කෙරේ. පෞද්ගලික පරිභෝජන වියදමට රජයේ පුද්ගල පරිභෝජන වියදම එකතු කළ විට කුටුම්භයන්ගේ සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම ලබා ගත හැක.

මෙම ප්‍රවේශය යටතේ ජාතික ගණුම්කරණයේ දී දළ දේශීය නිෂ්පාදිතය, දළ දේශීය වියදම සහ ශුද්ධ අපනයන අතර සම්බන්ධතාවය පැහැදිලි වේ. දළ දේශීය වියදමෙහි අගයත්, දළ දේශීය නිෂ්පාදිතයේ අගයත් අතර අඩු හෝ වැඩි වීමේ වෙනසට හේතු වන්නේ ශුද්ධ අපනයන හෙවත් භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂයේ බලපෑම මගිනි. ශුද්ධ අපනයනය ඍණ අගයක් ගන්නා අවස්ථාව හෙවත් ආනයන වියදම් අපනයන ආදායම ඉක්මවා යන අවස්ථාවේදී දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ දේශීය වියදම ඉහළ අගයක් ගනී. අපනයන ආදායම, ආනයන වියදම ඉක්මවා යන විට (ශුද්ධ අපනයන ධන අගයක් ගන්නා විට) දළ දේශීය වියදම දළ දේශීය නිෂ්පාදිතයට වඩා පහළ අගයක් ගනී.

දළ දේශීය නිෂ්පාදිතය $(Y) = C + I + G + (X - M)$

දළ දේශීය වියදම $(E1) = C + I + G$

ශුද්ධ අපනයන $= (X - M)$

## 2.6 ජාතික ගිණුම්කරණයේ වැදගත්කම සහ සීමාවන්

නිමැවුම්, ආදායම් හා වියදම් යන ත්‍රිවිධ ප්‍රවේශ යොදා ගනිමින් ජාතික ගිණුම් පිළියෙළ කර ලබා ගන්නා දත්ත ඉතා වැදගත් වේ. සමස්ත ආර්ථිකයේ ව්‍යුහය, සාධනය හා හැසිරීම අවබෝධ කර ගැනීමට හා ආර්ථිකය කළමනාකරණය කිරීමට එම දත්ත යොදාගැනීමට හැකිය. ජාතික ගිණුම්කරණයේ ප්‍රධාන භාවිත කීපයක් පහද පරිදි පෙළ ගැස්විය හැකිය.

- ආර්ථිකයේ කාර්ය සාධනය ඇගයීමට යොදා ගැනීම.
- ආර්ථික වෘද්ධිය මැනීම.
- ඒක පුද්ගල ජාතික නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීම.
- ආර්ථිකයේ ව්‍යුහමය ලක්ෂණ අනාවරණය කර ගත හැකි වීම.
- කාර්යාත්මක ආදායම් ව්‍යාප්තිය අනාවරණය වීම.
- අන්තර්ජාතික සංසන්දනයන් සඳහා භාවිත කළ හැකි වීම.
- ආර්ථික කාරක අතර ශ්‍රිතාත්මක සම්බන්ධතා හඳුනා ගත හැකි වීම.
- සම්පත් සංයුතිය හා උපයෝජනය අනාවරණය වීම.
- ආර්ථික කළමනාකරණය සඳහා තොරතුරු ලබා ගැනීමට හැකි වීම
- සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පුරෝකථනය කළ හැකි වීම

ජාතික ගිණුම්කරණයේ සීමාවන් පහත පරිදි පෙළගැස්විය හැකිය.

- නොවිධිමත් ආර්ථිකය තුළ සිදුවන ඵලදායී නිෂ්පාදන ඇතුළත් නොවීම
- යැපුම් ආර්ථික කටයුතු ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම
- ගෘහනියන්ගේ සේවය ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම
- රාජ්‍ය ණය පොළී ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමට ඇතුළත් කර නොගැනීම
- නිෂ්පාදන නිසා පරිසරයට සිදුවන හානිය සැලකිල්ලට නොගැනීම
- රාජ්‍ය සේවාවල ඵලදායීතාවේ ඇති වන වෙනස් වීම සලකා නොලැබීම
- යුද හා ආරක්ෂණ කටයුතු සඳහා දරන වියදම් ඵලදායි නිෂ්පාදනයක් ලෙස සැලකීම
- කල් පවත්නා ඇතැම් පාරිභෝගික භාණ්ඩ ආයෝජනයක් ලෙස සලකා ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොකිරීම

### ආශ්‍රිත ග්‍රන්ථ

චන්ද්‍රදාස, ඒ. ජේ. එම්. (2019). අන්තර් මධ්‍යස්ථීත සාර්ව ආර්ථික විද්‍යාව.

ජාතික අධ්‍යාපන ආයතනය (2017). ආර්ථික විද්‍යාව - ගුරු මාර්ගෝපදේශය.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය (2019). ව්‍යාපාර ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව.